රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2021

මගේ අංකය : EST 5/6/9/11
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.11.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය

“රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016” මැයෙන් නිකුත් කළ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හා “රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය” මැයෙන් නිකුත් කළ 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ක්‍රියාත්මක වන දිනට පෙර පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ තනතුරු තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහිලා සැලකීමට 2021.07.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. ඒ අනුව, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 11.3 වගන්තිය හා 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017හි 03 ඡේදය යටතේ ඇති 11.3 වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

> **"11.3 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ යම් තනතුරක් තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහි ලා සලකනු ලබයි."**

03. මෙම සංශෝධනය 2021.07.05 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය